ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 - 2024

---

1. විගණන මතය

1.1 ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 ක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 2024 වර්ෂයට අදාලව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 කට අදාලව නිකුත් කර තිබුණු විගණන වාර්තා 22 හි තත්ත්වාගණනය කළ මතයක් ප්‍රකාශ කර තිබුණ අතර එම මතයන් සඳහා හේතුවී තිබුණු ප්‍රමාණාත්මක නිරීක්ෂණයන් පහත දැක්වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් ඇතුළු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි 40 ඡේදය ප්‍රකාරව අස්ථිත්වයක් විසින් එහි ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීමේදී පිරිවැය ආකෘතිය හෝ ප්‍රත්‍යාගණන ආකෘතිය තෝරාගත යුතු අතර එම ප්‍රතිපත්තිය දේපළ පිරියත හා උපකරණ පන්තිය සඳහාම ව්‍යවහාර කළයුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 22 හි ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි.	කොමසාරිස් තුමාගේ අනුමැතිය මත ඉදිරියේදී නිවැරදි කරගන්නා බව.	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ගිණුම්ගත කළ යුතුය.
(ආ)	ගොවිජනසේවා මධ්‍යස්ථාන 06 ක් විසින් සමාලෝචිත වර්ෂය තුල අදාළ ක්ෂය කිරීමේ ප්‍රතිපත්තියට අනුව ක්ෂය කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර ඇති ක්ෂය ප්‍රතිපත්තියට අනුව ක්ෂය කිරීමට කටයුතු කල යුතුය.
(ඇ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 7 ක තොග අගය කිරීමේ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරියේදී තොග අගය කිරීමේ ප්‍රතිපත්ති හෙළිදරව් කරන බව.	තොග අගය කිරීමට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කළ යුතුය.
(ඈ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 ක සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ණයගැතියන් සඳහා අදාළ වෙන් කිරීම් සිදු කර නොතිබුණි.	ඉදිරියේදී අදාළ වෙන්කිරීම් සිදුකිරීමට කටයුතු කරන බව.	ණයගැතියන් සඳහා අදාළ වෙන්කිරීම් සිදුකල යුතුය.

(ඉ)	ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් අක්කර බදු ආදායම් හා ස්ථාවර තැන්පතු පොළී ආදායම මුදල් පදනම මත මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	ඉදිරියේදී නිවරදිව සකස්කිරීමට කටයුතු කරන බව.	ආදායම් සහ වියදම් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශන තුළ දැක්විය යුතුය.
(ඊ)	ගොවි බැංකුව හා ගොවිජන කාරක සභාව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 ක් විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.	උපදෙස් පරිදි ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට කටයුතු කල යුතුය.
(උ)	ගොවි බැංකු 05 ක මූල්‍ය ප්‍රකාශනවල සියළු සංඛ්‍යාත්මක තොරතුරු පසුගිය කාලපරිච්ඡේදය සමඟ සංසන්දනාත්මකව හෙළිදරව් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග සංසන්දනාත්මකව ඉදිරිපත්කිරීමට කටයුතු කල යුතුය.
(ඌ)	සමාලෝචිත වර්ෂය තුල ගොවීන්ගෙන් ලැබී තිබුණු රු.1,101,915 ක් වූ පරිත්‍යාග ගොවිජන සේවා කාරක සභාවේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත්කර තිබුණු නමුත් විස්තරාත්මක තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණි.	අනාගතයේදී ගිණුම්කරණය ආශ්‍රිත ක්‍රියාකාරකම් කෙරෙහි නිසි අවධානයක් යොමු කිරීම සහතික කිරීමට පියවර ගෙන ඇත.	ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලැබෙන පරිත්‍යාග පිළිබද තොරතුරු විධිමත්පරිදි ලේඛණගත කිරීමට මෙන්ම ප්‍රමිතීන්ට අනුව ගිණුම්ගතකිරීමටද කටයුතු කළ යුතු වේ.
(එ)	ගොවින් සදහා ණය නිකුත් කිරීමේදී අදාළ ණය මුදල් හා ණය ආපසු ගෙවීම් ණය ගැති ලෙජරයේ සටහන් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාළව ගොවිජනසේවා කාරක සභාවක් විසින් ලබා දී තිබුණු ණය වලට අදාල තොරතුරු ණය ලෙජරය තුල ඇතුලත්කර නොතිබුණි. ණය ගනුදෙනු 13 කට අදාළ නියැදි පරික්ෂාවේදී වටිනාකම රු.700,000 ක් වූ ණය ගනුදෙනු ණය ලෙජර තුළ ඇතුළත් කර නොතිබුණි.	එකග වෙමි. ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි.	ගොවින් වෙත ණය ලබා දීමේදී විධිමත්ව ගිවිසුම්ගතව ණය ලබාදිය යුතු අතරම ලබාදෙන ණය තොරතුරු ණය ලෙජරයේ ඇතුලත් කිරීමටද කටයුතු කළ යුතු වේ.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ගොවිජනසේවා මධ්‍යස්ථාන 14 ක එකතු වටිනාකම රු.3,335,524 ක් වූ ක්ෂය වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වර්ෂයට අදාළ ක්ෂය වියදම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක එකතු වටිනාකම රු.82,234 ක් වූ ක්ෂය වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ වැඩියෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	- එම -	- එම -
(ඇ)	සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකකට අදාළව එකතු වටිනාකම රු.66,540 ක් වූ කාමර කුලී අදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	- එම -	වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුය
(ඈ)	සමාලෝචිත වර්ෂයේ ගොවිජන සේවා කාරක සභා දෙකක එකතු වටිනාකම රු.218,754 ක් වූ අදායම් මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	- එම -	- එම -
(ඉ)	ගොවිජන සේවා මධ්‍යස්ථානයක සමාලෝචිත වර්ෂය තුළදී ණය පදනම මත ලබාගෙන තිබුණු පොහොර මලු වෙනුවෙන් වූ රු.190,000 ක වියදම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ ඇතුලත්කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	මෙම ඡේදය සඳහා පිළිතුරු ඉදිරිපත්කර නොමැත.	වර්ෂයට අදාළ වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අදාළ ගැලපීම් සිදු කළ යුතුය.
(ඊ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 08 ක අක්කර බදු ලේඛණය අනුව සමාලෝචිත වර්ෂයට අදාළ අක්කර බදු අදායම රු.4,722,937 ක් වුවද එය රු.4,058,310 ක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.664,627 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	වර්ෂයට අදාළ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අදාළ ගැලපීම් සිදු කළ යුතුය.
(උ)	ගොවිජන සේවා මධ්‍යස්ථානයක පොහොර විකුණුම් ගිණුම අනුව විකුණුම් වටිනාකම රු. 8,866,300 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ එය රු.9,260,450 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ විකුණුම් රු.394,150 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.	- එම -	- එම -

(ඖ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 03 ක් විසින් සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු එකතු වටිනාකම රු.1,210,855 ක් වූ ජංගම නොවන වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත්කර නොතිබුණ අතර, ඒවා අයභාර වියදම් ලෙස ලියා හැර තිබුණි.	- එම -	වර්ෂය තුළ මිලදී ගන්නා ලද සියලුම ජංගම නොවන වත්කම් නිසි පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු අතර අදාළ ගැලපීම් සිදු කළ යුතුය.
(එ)	ගොවිජනසේවා මධ්‍යස්ථාන 05 ක් වෙත ලැබී තිබුණු එකතු වටිනාකම රු.2,724,500 ක් වූ Shader යන්ත්‍ර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත්කර නොතිබුණි.	- එම -	ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලැබී ඇති සියලුම වත්කම් වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඒ)	ගොවිජන සේවා මධ්‍යස්ථානයක් විසින් ප්‍රතිලාභීන්ට සහනාධාර පදනම මත ලබාදුන් ට්‍රැක්ටර් යන්ත්‍ර වෙනුවෙන් අදාළ ආයතන වෙත ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් ගෙවිය යුතු රු.700,578 ක වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා නොතිබුණි.	- එම -	සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගොවිජන සේවා මධ්‍යස්ථාන විසින් ගෙවිය යුතු ගිණුම් ශේෂ නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂය තුලදී ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක් වෙත පරිත්‍යාග ලෙස ලැබුණු එකතු වටිනාකම රු.198,000 ක් වූ ජංගම වත්කම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුළත්කර නොතිබුණි.	- එම -	ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පරිත්‍යාග ලෙස ලැබෙන සියලුම වත්කම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඕ)	ගොවිජන සේවා කාරක සභා 02 ක එකතු වටිනාකම රු.123,204 ක් වූ ජංගම වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා නොතිබුණි.	- එම -	ගොවිජන සේවා මධ්‍යස්ථානය සතුව පවතින මධ්‍යස්ථානයට අයත් සියලුම වත්කම් ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ක)	ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට TSP සහ යූරියා පොහොර ශේෂය රු.1,799,395 ක් වුවද එය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.2,041,683 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් හා අතිරික්තය රු.242,288 ක් වැඩියෙන් දක්වා තිබුණි.	- එම -	ගිණුම් වර්ෂය අවසන් දිනට ගොවිජන සේවා මධ්‍යස්ථානය සතුව පවතින තොග ශේෂයන් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අදාල ගැලපීම් කළ යුතුය.

(ට)	ගොවිජන සේවා මධ්‍යස්ථානයක බීජ වී ණයට විකිණීම වෙනුවෙන් වූ රු.565,250 ක ණය ගැති වටිනාකම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ අඩුවෙන් ඇතුලත්කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් හා අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	- එම -	ගිණුම් වර්ෂය අවසන් දිනට පවතින සියලුම ලැබිය යුතු ගිණුම් ශේෂ ගිණුම් ගත කිරීමට කටයුතු කළ යුතු අතර අදාළ ගැලපීම් කළ යුතුය.
(ත)	ගොවිජන සේවා කාරක සභාවක ගොවි බැංකුවේ අරමුදල් මඟින් මිලදී ගත් රු.375,130 ක් වූ පරිගණකයක් හා මුද්‍රණ යන්ත්‍රයක් ගොවිජන සේවා කාරක සභාව වෙත පවරා ගෙන තිබුණද ගොවිජනසේවා කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ එය ඇතුලත්කර නොතිබුණි.	- එම -	පවරාගත් වත්කම් ගොවිජන සේවා කාරක සභාවේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.
(ප)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 03ක් විසින් භෞතිකව හෝ ලේඛණමය වශයෙන් තහවුරු නොවූ ජංගම හා ජංගම නොවන වත්කම් රු.839,173 ක් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඇතුලත්කර තිබුණි.	- එම -	වත්කම් ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු අතර, අදාළ ගැලපීම් කළ යුතුය.
(ය)	ගොවිජන සේවා කාරක සභා 02ක එකතු වටිනාකම රු.980,638 ක් වූ වත්කම් මිලට ගැනීම් සමුච්චිත අරමුදලට බැර කර තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	- එම -	වත්කම් මිලට ගැනීමට අදාළ නිවැරදි ගිණුම්කරණ පිළිවෙත අනුව සටහන් තබා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ර)	සමාලෝචිත වර්ෂය තුලදී ගොවිජන සේවා මධ්‍යස්ථාන 05 කට අදාලව මෙහෙයුම් කටයුතු තුළින් ලද රු.124,156 ක් සහ ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද රු.427,497 ක් වූ මුදල් ප්‍රවාහයන් අදාළ නිවැරදි ක්‍රියාකාරකම් යටතේ ඇතුලත් කිරීමකින් තොරව දක්වා තිබුණි.	- එම -	එක් එක් ක්‍රියාකාරකම් යටතේ ජනනය වන ලැබීම් හා ගෙවීම් මුදල් ප්‍රවාහයන් අදාළ ක්‍රියාකාරකම් යටතේ වෙන් වෙන්ව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ සටහන් කිරීමට කටයුතු කළ යුතුය.
(ල)	ගොවිජන සේවා කාරක සභා 06ක එකතු වටිනාකම රු.3,603,160 ක් වූ වත්කම් මිලදී ගැනීම්, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවත් එය මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.	- එම -	- එම -
(ව)	ගොවිජන සේවා මධ්‍යස්ථානයක ගොවි බැංකුවේ 2021 ජුනි 5 දින සිට 2024 ජුනි 18 දක්වා කාලයට අදාළව අනාවරණය	- එම -	ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ සිදුවී ඇති හඳුනාගත් සියලුම

කරගෙන තිබුණු එකතු වටිනාකම රු.2,260,524 ක් වූ මූල්‍ය වංචාව පිළිබඳව ගොවි බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.		මූල්‍ය වංචාවන් සහ ප්‍රමාණාත්මක කරුණු මූල්‍ය ප්‍රකාශන සමග හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතු අතර, ඒ සඳහා විධිමත් පියවර ගත යුතුය.

1.3.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජනසේවා කාරක සභාවක ගිණුම් විෂයන් 10 ක ප්‍රවර්ථන වර්ෂයේ ආරම්භක ශේෂයන් හා පසුගිය වසරේ අවසන් ශේෂයන් අතර රු.7,522,868 ක නොසැසඳීමක් විය.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අදාළ සැසඳීම් සිදුකර නිවැරදි ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	ගොවිජන සේවා මධ්‍යස්ථානයක ගොවි බැංකුවෙහි ඉතිරි කිරීමේ ගිණුමේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව හා බැංකු පාස් පොතට අනුව රු.4,433,968 ක් ලෙස දක්වා තිබුනද මුදල් පොතට අනුව එය රු.659,345 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.3,774,623 ක නොසැසඳීමක් විය.	- එම -	- එම -
(ඇ)	ගොවිජන සේවා කාරක සභාවක MOP පොහොර වෙළඳ ගිණුමේ පෙර වර්ෂයේ අවසාන දිනට තොග ශේෂය රු.10,516,419 ක් වී තිබුණ ද ප්‍රවර්ථන වර්ෂයේ ආරම්භක ශේෂය රු.8,151,391 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.2,365,028 ක නොසැසඳීමක් විය.	- එම -	- එම -
(ඈ)	ගොවිජන සේවා කාරක සභාවක 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් යටතේ දක්වා ඇති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ට්‍රැක්ටර් හා කෘෂි උපකරණ වාරිකය රු. 170,000 ක් වුවද ට්‍රැක්ටර් රථ ලබා දුන් ගොවීන්ගෙන් අයවිය යුතු මුදල ලෙස රු.684,000 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් පියවිය යුතු ශේෂ හා ලැබිය යුතු ශේෂ අතර රු.514,000 ක නොසැසඳීමක් විය.	- එම -	- එම -

(ඉ)	සමාලෝචිත වර්ෂය තුළ ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 කට අදාළව එකතු වටිනාකම රු.82,415,747 ක් වූ ගනුදෙනු 24ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ රු.77,589,088 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.4,826,659 ක නොසැසඳීමක් විය.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අදාළ සැසඳීම් සිදු කර මුදල් ලැබීම හා ගෙවීම් වලට අදාළ සියලුම මුදල් ප්‍රවාහයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය.

1.3.4 අවිනිශ්චිත ගිණුම්

විෂය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජනසේවා කාරක සභා 02 කට අදාළ එකතු වටිනාකම රු.389,195 ක් වූ අවිනිශ්චිත ගිණුම් ශේෂ දෙකක් සමාලෝචිත වර්ෂය තුළදී ද නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි.	දීර්ග කාලයක සිට පැවත එන අතර ඉදිරියේදී නිසි අනුමැතියකින් යුතුව මුලා ප්‍රකාශන වලින් ඉවත්කිරීමට කටයුතු කරන බව.	අවිනිශ්චිත ගිණුම ඇතිවීමට හේතු හඳුනාගෙන ඒ අනුව විධිමත් අධිකාරිය මත අවිනිශ්චිත ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.3.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 22 කට අදාළව එකතු වටිනාකම රු. 4,457,769 ක් වූ ජංගම නොවන වත්කම්, එකතු වටිනාකම රු. 81,052,313 ක් වූ ජංගම වත්කම්, එකතු වටිනාකම රු. 3,111,050 ක් වූ ජංගම නොවන වගකීම්, එකතු වටිනාකම රු.135,847,421 ක් වූ ජංගම වගකීම් හා එකතු වටිනාකම රු72,967,662 ක් වූ ආදායම් ශේෂයන් සඳහා වූ ස්ථාවර වත්කම් ලේඛනය, විස්තරාත්මක උප ලේඛන, ස්ථාවර තැන්පත් සහතික, යාවත්කාලීන කරන ලද ණය ගැති ලේඛන, යාවත්කාලීන කරන ලද ණය හිමි ලේඛන, ශේෂ සනාථ කිරීම්, කාල විශ්ලේෂණ, තුලනය කරන ලද ලෙජර් ගිණුම්, තොග ලේඛන, මුදල් පොත්, බැංකු සැසඳුම්, බැංකු ප්‍රකාශන, තැන්පත් ලේඛන, බැංකු පාස් පොත්, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් විසින් ගොවීන්ට ලබා දුන් පොහොර වවුචර් සම්බන්ධ තොරතුරු, ණය ලබා ගැනීමට අදාළ ගිවිසුම්, ණය ගෙවීම් වාර්තා, ගොඩ ඉඩම් ඇතුළත් කෘෂිකාර්මික ඉඩම් ලේඛනය, ආදායම් හා වියදම් ලේඛන නොමැතිවීම හේතුවෙන් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	සහකාර කොමසාරිස්වරයාගේ අනුමැතියෙන් පසු සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ.	වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් ශේෂ තහවුරු කර ගැනීමට අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.

1. 4 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීතී, රීති, රෙගුලාසි යනාදියට යොමුව	අනුකූල නොවීම රු.	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත			
	(i) 43(9) වගන්තිය	වසර දෙකකට වැඩි කාලයක් මහා සභා රැස්වීමක් නොපැවැත්වූ ගොවි සංවිධාන 56 ක් සඳහා මහා සභා රැස්වීමක් කැඳවීමට ගොවිජනසේවා මධ්‍යස්ථාන 05 ක ට අදාළ විධායක කමිටු පියවර ගෙන නොතිබුණි.	ගොවි සංවිධානවල වාර්ෂික මහා සභා රැස්වීම ඉදිරි වර්ෂය තුළ පැවැත්වීමට පියවර ගනු ලැබේ.	අදාළ නීති රීති රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතු වේ.
	(ii) 53 (4) වගන්තිය	ගොවිජන සේවා මධ්‍යස්ථාන 09 ක් විසින් සෑම වසර තුනකට වරක් කෘෂිකාර්මික ඉඩම් ලේඛනය සමාලෝචනය කර සහතික කිරීමේ ක්‍රියාවලිය ගොවිජනසේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් සිදු කර නොතිබුණි.	අවසන් සහතික කිරීම 2019 දී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඉදිරියේදී නැවත එසේ සිදුකිරීමට බලාපොරොත්තු වෙමි.	- එම-
	(iii) 55 (1) වගන්තිය	ගොවිජන සේවා මධ්‍යස්ථාන 09 ක් විසින් කෘෂිකාර්මික ඉඩම් මැනීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි.	ඉඩම මැනීම සඳහා පියවර ගැනීම කෙරෙහි දිස්ත්‍රික් කාර්යාලයේ අවධානය යොමු වී තිබේ.	අදාළ නීති රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	(i) මුදල් රෙගුලාසි 110	ගොවිජන සේවා මධ්‍යස්ථාන 15 ක් විසින් හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේදී පවත්වා ගැනීමට පියවර ගන්නා බව.	අදාළ නීති රීති රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතුය.
	(ii) මුදල් රෙගුලාසි 245(3)	සියළුම වවුචර්වල අදාළ විස්තර නියමිත ලෙජරයේ නියමිත ගිණුම් යටතේ පොත්වල සටහන් කළ යුතු	ඉදිරියේදී කටයුතු කරන බව.	- එම -

	වුවත්, ගොවිජන සේවා මධ්‍යස්ථාන 08 ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි.		
(iii) මුදල් රෙගුලාසි 262(2)	ගෙවන ලද සියළුම වවුචර් සඳහා නැවත් වරක් ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීමේ අවදානම මගහැර ගැනීම සඳහා “ගෙවන ලදී” මුද්‍රාව තැබිය යුතු වුවත්, ගොවිජනසේවා මධ්‍යස්ථාන 11 ක් විසින් එසේ කටයුතු කර නොතිබුණි.	- එම -	- එම -
(iv) මුදල් රෙගුලාසි 502(2)	ගොවිජනසේවා මධ්‍යස්ථාන 14 ක් විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.	ඉදිරියේදී පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	- එම -
(ඇ) ගොවිජන සේවා කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛ			
(i) 1987 පෙබරවාරි 18 දිනැති අංක 55 දරන චක්‍රලේඛය	වර්ෂ ගණනාවක සිට ඉදිරියට එන අයකරගත යුතු හර ශේෂ අයකර ගැනීමට හෝ එසේ කළ නොහැකි විට විධිමත් අධිකාරය මත පොත් වලින් කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	වසර ගණනාවක සිට පැවත එන ශේෂ බැවින් මේ සම්බන්ධයෙන් තොරතුරු ගොවිජන සේවා කාරක සභාව සතුව නොමැති බවත්,මෙම ශේෂ ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරන බව.	- එම -
(ii) 1981 ඔක්තෝබර් 16 දිනැති ගොවිජන සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 107 හි 30.2 ඡේදය	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ණයගැති ශේෂයන්ගේ නිවැරදි බව අදාළ ණයගැතිගෙන් තහවුරු කරගෙන එම තහවුරු කිරීම් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.	වසර ගණනාවක සිට පැවත එන ශේෂ බැවින් මේ සම්බන්ධයෙන් තොරතුරු ගොවිජන සේවා කාරක සභාව සතුව නොමැති බවත්,මෙම ශේෂ ඉදිරියේදී ඉවත් කිරීමට කටයුතු කරන බව.	- එම -
(iii) 2016 පෙබරවාරි 09 දිනැති අංක 2016/03 දරන චක්‍රලේඛයේ 02 ඡේදය	සෑම කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියෙකු විසින් අවම වශයෙන් මාස 04 කට වරක්වත් ගොවි සංවිධාන පරීක්ෂා කර ගොවි සංවිධාන පරීක්ෂණ වාර්තාවක්	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	- එම -

		ගොවිජන සංවර්ධන නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එපරිදි කටයුතු කර නොතිබුණි.		
(iv)	2020 ජුනි 25 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 08/20	මුදල් හා ශේෂ කටයුතු සම්බන්ධයෙන් කටයුතු කරන රජයේ නිලධාරීන් ඇප තැන්පත් කළ යුතු වුවද, 2024 වර්ෂය වන විට ගොවිජන සේවා මධ්‍යස්ථාන 22 ක නිලධාරීන් 53 දෙනෙකුගෙන් රු. 442,500 ක ඇප තැන්පත් මුදල අයකරගෙන නොතිබුණි.	දිස්ත්‍රික් සහකාර කොමසාරිස්වරයාගේ උපදෙස් පරිදි බැඳුම්කරය ගෙවීමට කටයුතු කරනු ලැබේ.	- එම -
(ඇ)	භාණ්ඩාගාර ලේකම්ගේ 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මක්, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සහ අභ්‍යන්තර විගණන සැලැස්මක් ඇතුළුව සම්පූර්ණ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට නියමකර තිබුනද ගොවිජනසේවා මධ්‍යස්ථාන 13 ක් විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.	ඉදිරි වසර සඳහා විධිමත් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර පවත්වාගෙන යනු ලැබේ.	- එම -

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 22 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු. 27,607,659 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.14,424,955 ක් වීම හේතුවෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,182,704 ක වර්ධනයක් නිරීක්ෂණය විය. එසේම ගොවි බැංකු 22 ක සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලයේ එකතුව රු. 9,633,936 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,559,710 ක් වීම හේතුවෙන් ගොවි බැංකුවල මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,074,226 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජනසේවා මධ්‍යස්ථාන 06 ක රු.1,264,657 ක් වූ ජංගම ගිණුම් ශේෂයක් සහ රු.115,502 ක් වූ ඉතුරුම්	මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගනිමින් පවතී.	අක්‍රියව පවතින ගිණුම් ශේෂයන් විධිමත් අනුමැතිය මත එලදායි සහ කාර්යක්ෂම

	ගිණුම් ශේෂයක් වසර ගණනාවක සිට අක්‍රීයව පැවතුණි.		ආයෝජන මාර්ගවල යෙදවීමට කටයුතු කළ යුතුය.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රු.191,334 ක් වූ යූරියා පොහොර තොගයක් සමාලෝචිත වර්ෂය තුළ රු.115,200 කට අලවි කිරීම හේතුවෙන් ගොවිජනසේවා කාරක සභාවට රු.76,134 ක පාඩුවක් සිදුවී තිබුණි.	අලාභය පියවා ගැනීම සඳහා අතිරික්ත මුදල අයකර ගන්නා ලෙස අදාළ සමාගමට ලිඛිත දැනුම්දීමක් නිකුත් කර ඇත.	නියමිත කාල සීමාවන් තුල ප්‍රමාදයකින් තොරව අලවි කිරීමට කටයුතු කළ යුතු අතර, අලාභය පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් අයකරනු ලබන කාමර කුලී ආදායම 2023 අගෝස්තු 23 දිනැති අංක 09/2015 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව සංශෝධනය කර කාමර කුලී අයකිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී කාමර කුලී ආදායම රු.255,720 ක් අඩුවෙන් අයකර තිබුණි.	දිස්ත්‍රික් කාර්යාලයට දැනුම් දී ඇත	අදාළ චක්‍රලේඛන වලට අනුකූලව නිවැරදි ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් කලාපයේ පවතින වී වගා කල හැකි කුඹුරු ඉඩම් අක්කර 1,747 ක් වී වගාව සඳහා භාවිතා නොකර පැවතුණි.	මෙම ඉඩම් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනය වේ.	වී වගා කල හැකි කුඹුරු ඉඩම් පවතීනම් නීතිමය තත්වයන් සලකා බලා අදාළ අයිතිය නිරවුල් කර ගෙන රටේ නිෂ්පාදනය ඉහල නැංවීම වෙනුවෙන් වී වගාව සඳහා භාවිතා කිරීමට කටයුතු කල යුතුය.
(ඇ)	ගොවින් වෙත ණය පදනම මත ලබාදී තිබුණු නමුත් ණය ආපසු අය නොවීම මත ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් ආපසු අත්පත් කරගත් වටිනාකම රු.111,755 ක් වූ රෝද දෙකේ ට්‍රැක්ටරය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.	අපහරණය කිරීමට පියවර ගනු ලැබේ.	අදාළ ණය මුදල් අයකර ගැනීමට හෝ අය නොවන්නේනම් විධිමත් පරිදි කපා හැරීමට හා යන්ත්‍රය භාවිතයට ගත නොහැකිනම් විධිමත් පරිදි ඉවත් කිරීමට කටයුතු කල යුතුවේ.
(ඈ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 02 ක ගොවි බැංකු අංශයේ කාර්ය මණ්ඩලයක්	ප්‍රමාණවත් නිලධාරින් පිරිසක් නොමැති බව.	අනුමත කාර්ය මණ්ඩලය හඳුනාගෙන ඒ අනුව සුදුසු

	ස්ථාපිත නොකර තාවකාලික බැංකු සහකාර හා කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින් වෙත බැංකු අංශයේ සියළු රාජකාරි පවරා තිබුණි.		ස්ථිර කාර්ය මණ්ඩලයක් පත්කර ගැනීමට කටයුතු කල යුතුවේ.
(ඉ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 03 ක පෙර වර්ෂවල සිට පැවත එන එකතුව රු.163,180,759 ක් වූ ගිණුම් ශේෂ 30 ක් සමාලෝචිත වර්ෂය වන විටත් නිරාකරණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනුමැතිය සදහා යොමුකර ඇති අතර ඉදිරියේදී නිරවුල් කිරීමට බලාපොරොත්තු වන බව.	විධිමත් පරීක්ෂාවක් සිදු කර ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම් ශේෂයන් කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය
(ඊ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 03 ක පවතින එකතු වටිනාකම රු.562,000 ක් පමණ වන සහ වටිනාකම සොයාගත නොහැකි ට්‍රැක්ටර් යන්ත්‍ර,වතුර මෝටර්,ජල නල පද්ධති, කොම්පෝස්ට් පොහොර සකස්කරන යන්ත්‍රය හා කොළමඩින යන්ත්‍ර වසර ගණනක සිට අක්‍රියව ගාල් කර තිබුණි.	සහකාර කොමසාරිස් තුමාගේ අනුමැතිය මත ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව.	ගොවිජන සේවා කාරක සභාව සතු වත්කම් අලුත්වැඩියා කල හැකි තත්වයේ පවතීද යන්න හදුනාගෙන අලුත්වැඩියා කර ඵලදායි ලෙස භාවිතා කිරීමට හෝ අලුත්වැඩියා කල නොහැකිනම් විධිමත් පරිදි අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන දෙකක රු.1,081,821 ක් වටිනා පොහොර තොගයක් නියමිත කාල සීමාව තුළ බෙදා දීමට හෝ අලෙවි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් කල් ඉකුත් වී තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි 104 අනුව කටයුතු කර හානි පාඩු පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අදාළ කාලය තුළ ගොවීන් වෙත බෙදා දීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 ක වසර කිහිපයක සිට ගබඩා කර තිබුණු කාබනික පොහොර ටොන් 16,908 ක් සහ වටිනාකම රු.419,262 ක් වූ එළවලු බීජ තොගයක් ප්‍රයෝජනයට නොගෙන පැවතුනි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	අවශ්‍යතාවය හදුනාගෙන ඒ අනුව මිලදී ගැනීමට කටයුතු කල යුතු අතරම මිලදීගත් අයිතම කල් ඉකුත්වීමට පෙර නිකුත් කිරීමට හෝ භාවිතා කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2020 ඔක්තෝබර් 08 දිනැති අංක 09/2020 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 3.12 ඡේදය අනුව අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමකින් තොරව ගොවි බැංකුවක් විසින් ගොවීන් 12 දෙනෙකුට වටිනාකම	පිලිගනිමි ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.	එක් එක් ණය වර්ගය සහ ණය වටිනාකම අනුව පවතින සහ අවශ්‍ය අනුමැතීන් මත පමණක් ණය නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර

	රු.745,400 ක් වූ ණය මුදලක් ලබාදී තිබුණි.		එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය.
(ඈ)	භාණ්ඩ ණයට විකිණීමට අදාළ ණය ඉල්ලුම් පත්‍ර සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වුවත් එසේ ලබා ගැනීමකින් තොරව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් විසින් රු.2,528,880 ක භාණ්ඩ ණයට නිකුත්කර තිබුණි.	පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි.	එක් එක් ණය වර්ගය සහ ණය වටිනාකම අනුව පවතින සහ අවශ්‍ය අනුමැතීන් මත පමණක් ණය නිකුත් කිරීමට කටයුතු කළ යුතු අතර එසේ නොකළ පාර්ශවයන්ට එරෙහිව පියවර ගත යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ගොවිජන සේවා කාරක සභා 06 ක තණකොළ කපන යන්ත්‍ර 04 ක්, වල් නෙලන යන්ත්‍ර 04 ක්, ගොයම් කපන යන්ත්‍ර 05 ක්, සීසෑමේ යන්ත්‍ර 01 ක් සහ බහු-කැපුම් යන්ත්‍ර 01 ක්, රෝද දෙකේ ට්‍රැක්ටරයක් සහ නගුලක් වසර ගණනාවක සිට භාවිතයට ගෙන නොතිබුණි.	කෘෂිකර්ම සංවර්ධන මණ්ඩලයෙන් අවසර ලබා ගැනීමෙන් පසු, එම යන්ත්‍රෝපකරණ අලුත්වැඩියා කර ආදායම් උපයා ගැනීම සඳහා කුලී පදනම මත ලබා දීමට කටයුතු කරනු ලැබේ.	ගොවිජන සේවා කාරක සභා සතුව තිබෙන වත්කම් අලුත්වැඩියා කල හැකි මට්ටමේ පවතීනම් අලුත් වැඩිය කර ඵලදායි ලෙස භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු අතර, එසේ නොමැති වත්කම් විධිමත් පරිදි අපහරණය කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂය වන විට ගොවිජනසේවා කාරක සභා 15ක සංවර්ධන නිලධාරින් 11 ක්, කෘෂි සංවර්ධන නිලධාරින් 10 ක්, කළමනාකරණ සහකාර නිලධාරින් 13 ක්, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරින් 55 ක්, ආරක්ෂක සේවකයන් 03 ක් සහ කම්කරුවන් 05 දෙනෙකුගේ ඌනතාවයක් පවතින බව නිරීක්ෂණය විය.	මානව සම්පත් සම්බන්ධ තොරතුරු දිස්ත්‍රික් සහකාර කොමසාරිස් වෙත ඉදිරිපත් කර ඇත.	කාර්ය මණ්ඩල මට්ටම් නැවත සමාලෝචනය කර අවශ්‍ය පුරප්පාඩු පිරවීමට පියවර ගත යුතුය.

05. ගොවි බැංකු

විගණන නිරීක්ෂණය		කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගොවි බැංකු සම්බන්ධයෙන් වූ 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ අංක 2.4.1 වගන්තිය අනුව ගොවින් නිෂ්පාදනය, සැකසුම් හා අලවිකරන කටයුතුවල යෙදීම දිරිමත් කිරීම සඳහා සැලැස්මක් සකස් කිරීම ණය පාලන කමිටුවේ සහ ගොවිජන සංවර්ධන නිලධාරියාගේ වගකීම් බව සඳහන් කර ඇතත් ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 ක එම අරමුණින් ඉතුරුම් සහ ණය කටයුතුවලට ඇතුළත් කිරීම සඳහා විභව ගනුදෙනුකරු සැලැස්මක් සකස්කර නොතිබුණි.	ඉදිරියේදී සකස්කිරීමට කටයුතු කරන බව.	අදාළ චක්‍රලේඛයේ දැක්වෙන පරිදි කටයුතු කල යුතුවේ.
(ආ)	ණය ගිවිසුම් කාලය ඉකුත් වී ඇති එකතු වටිනාකම රු.33,277,694 ක් වූ ගොවිජනසේවා කාරක සභා 07 කට අදාලව ණය ශේෂයන් 239 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව.	ණය ලබා දීම හා අයකිරීමට කාලීනව කටයුතු නොකිරිම පිළිබඳ විධිමත් පරීක්ෂාවක් සිදු කර අදාළ පාර්ශව වෙත පියවර ගැනිමත්, අය විය යුතුව පවතින හිඟ ණය ශේෂයන් අයකරගැනීමට අවශ්‍ය පියවර ගැනීමටත් කටයුතු කළ යුතුය.
(ඇ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 06 කට අදාළව ගොවි බැංකුවල වවුචර් පොත් එකතු කිරීම, වවුචර් නිකුත් කිරීම, මුදල් ලබා ගැනීම, දෛනික මුදල් ලේඛනය සකස් කිරීම, මුදල් ගෙවීම, වවුචර් සකස් කිරීම, බැංකු මුදල් හැසිරවීම, ණය ලබා දීම, මුදල් සුරක්ෂිතාගාරය ආරක්ෂා කිරීම සහ ගිණුම් සකස් කිරීම වැනි සියලු කාර්යයන් බැංකු අංශයේ එක් නිලධාරියෙකු විසින් පමණක් සිදු කරන බව නිරීක්ෂණය විය. ඒ අනුව මුදල් රෙගුලාසි 135 අනුව සෑම කාර්යක්ම නිලධාරීන් කිහිප දෙනෙකු විසින් අධීක්ෂණය කරනු ලබන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපිත කළ යුතු බව දක්වා තිබුනද, එසේ කටයුතුකර නොතිබුණි.	නිලධාරීන්ගේ පුරප්පාඩුවක් පවතින බැවින් එසේ සිදුකර ඇත. නිලධාරින් ඉල්ලුම් කර ඇති අතර ඉදිරියේදී ඒ අනුව කටයුතු කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව සෑම විටම නිලධාරින් කිහිප දෙනෙකු මගින් අධීක්ෂණයක් සිදුවන පරිදි අභ්‍යන්තර පාලන පද්ධතීන් ස්ථාපිත කර ඒ අනුව අධීක්ෂණය කිරීම සහ සිදුවිය හැකි වංචා සහ වැරදි වළක්වා ගැනීමට කටයුතු කල යුතුවේ.

(ඇ)	ගොවිජන සේවා මධ්‍යස්ථාන 04 ක ට අදාලව ගොවි බැංකුවල ක්‍රියාකාරකම් සහ ගනුදෙනු සම්බන්ධයෙන් පවත්වාගෙන යා යුතු ඉතුරුම් උප ලේඛනය, කුඩා කණ්ඩායම් ඉතුරුම් උප ලේඛනය, අනිවාර්ය ඉතුරුම් උප ලේඛනය සහ කොටස් උප ලෙජරය වැනි ගොවි බැංකුව විසින් සිදු කරන ලද ගනුදෙනු නිසි ලෙස වාර්තා කිරීම සඳහා පවත්වා ගත යුතු එම ලේඛන විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි.	නිලධාරීන් ඉල්ලුම්කර ඇති නමුත් තවමත් ලැබී නොමැති නිසා ඉදිරියේදී ලද පසු අවශ්‍ය කටයුතු සිදුකිරීමට බලාපොරොත්තු වන බව.	ගොවි බැංකු විසින් පවත්වා ගෙන යා යුතු ලේඛණ නිවැරදිව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුවේ.